# අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

# ඇබෑර්තු

SLIATE ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්ගේ යථා පරිදි සම්පූර්ණ කළ මාර්ගගත (http://www.sliate.ac.lk/app/forms/recruitments/) අයදුම්පත්, SLIATE ආයතනය වෙත 2021.04.21 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. **කරුණාකර අදාළ අයදුම්පතෙහි වඩාත් කැමති සේවා ස්ථාන (උපරිම 03 ක්) සඳහන් කරන්න. (බඳවා ගැනීමේදී, ආයතනයේ සේවා අවශ්‍යතා අනුව, අදාළ ස්ථානයන් වෙනස් විය හැක)**

## 01. ශිල්ප ප්‍රදර්ශක (ඇබෑර්තු 27)

| | විෂය ක්ෂේත්‍ර | සේවා ස්ථාන |
|---|---|---|
| A | පරිභෝජන විද්‍යා හා නිපැයුම් තාක්ෂණය (ඇබෑර්තු - 02) | ගම්පහ - 02 |
| B | ආහාර තාක්ෂණය (ඇබෑර්තු - 02) | ගම්පහ - 02 |
| C | කෘෂිකර්මය (ඇබෑර්තු - 01) | ගම්පහ - 01 |
| D | යාන්ත්‍රික ඉංජිනේරු (ඇබෑර්තු - 01) | ගාල්ල - 01 |
| E | විදුලි ඉංජිනේරු (ඇබෑර්තු - 03) | කොළඹ - 02<br>යාපනය - 01 |
| F | සිවිල් ඉංජිනේරු (ඇබෑර්තු - 02) | යාපනය - 02 |
| G | ප්‍රමාණ සමීක්ෂක (ඇබෑර්තු - 01) | ගාල්ල - 01 |
| H | තොරතුරු තාක්ෂණ (ඇබෑර්තු - 15) | රත්නපුර - 01<br>මඩකලපුව - 01<br>ගාල්ල - 02<br>අනුරාධපුර - 02<br>මන්නාරම - 01<br>තංගල්ල - 01<br>වව්නියාව - 01<br>බදුල්ල - 02<br>දෙහිවල - 01<br>අම්පාර - 01<br>ප්‍රධාන කාර්යාලය - 02 |

**අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

01. NVQ 7 තලයට නොඅඩු HND ඉංජිනේරු තොරතුරු තාක්ෂණ, කෘෂිකර්ම සුදුසුකම්

**සහ**

02. ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රදර්ශක කටයුතු කිරීමේ හැකියාව.

**වැටුප් පරිමාණය :**

MA 4-2016 - රු. 37,970 - 10x755 - 15x930 - 5x1,135 = 65,145/-

**සටහන :** එයට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

## 02. නිබන්ධක ( ඇබෑර්තු 02)

| විෂය ක්ෂේත්‍රය | සේවා ස්ථානය |
|---|---|
| ඉංග්‍රීසි භාෂා නිබන්ධක (ඇබෑර්තු - 02) | තංගල්ල - 01<br>රත්නපුර - 01 |

**අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

01. ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ සමාන සුදුසුකම්,

**සහ**

02. සුදුසුකම් ලබාගැනීමෙන් පසු වසර 3 ක ඉගැන්වීමේ පළපුරුද්ද

**වැටුප් පරිමාණය :**

MA 5-3 - 2016 රුපියල් 46,375 - 10x1,135 - 20x1,240 = 82,525/-

**සටහන :** එයට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

## 03. පුස්තකාල සහකාර - (ඇබෑර්තු 03)

| විෂය ක්ෂේත්‍රය | සේවා ස්ථානය |
|---|---|
| පුස්තකාල සහකාර (ඇබෑර්තු - 03) | වව්නියාව - 01<br>සමන්තුරේ - 01<br>යාපනය - 01 |

**අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

01. පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**හෝ**

02. පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් සහ උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ වසර 3 ක කාරක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :**

MA 3-2016 - රු. 32,200 - 10x445 - 11x660 - 10x730 - 5x750 - 54,960/-.

**සටහන :** එයට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි :**

01. තෝරාගත් අයදුම්කරුවන් විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, SLIATE ආයතනය විසින් ඒ සඳහා 15% දායකත්වයක් ලබා දේ. තවද, ආයතනය විසින් අමතර 3% ප්‍රමාණයකින් සේවක භාර අරමුදලටද (ETF) දායකත්වය ලබාදේ.
02. සියලුම වර්ගීකරණයන් සඳහා වයස් සීමාව අවුරුදු 45 ට අඩු විය යුතුවේ. කෙසේ වෙතත් රජයේ / රාජ්‍ය අංශයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්හට මෙම සීමාව අදාළ වේ.
03. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත්වල මුල් පිටපත්, අදාළ නිදේශය සමග අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතු වේ.
04. රජයේ දෙපාර්තමේන්තුවල විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන තෝරාගත් අයදුම්කරුවන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් මාර්ගයෙන් ඒ සඳහා මුදා හැරීම ලබාගත යුතු වේ. කෙසේ වෙතත් SLIATE ආයතනයේ සේවයේ නිරතවන කාලය තුළ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම නොලැබේ.
05. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සහතික කළ අදාළ සහතිකවල පිටපත් සහිතව වූ මුල් අයදුම්පත, සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,**
**අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**